# සී/ස ගිනිගත්හේන විවිධ සේවා සමුපකාර සමිතිය
# අයදුම්පත් කැඳවීම

සී/ස ගිනිගත්හේන විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 02/2019 චක්‍රලේඛ අනුව සුදුසුකම් සම්පූර්ණ කරන ලද මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියලුම අයදුම්පත් 2022.01.31 දින හෝ එදිනට පෙර ලියාපදිංචි තැපැලෙන් ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කර **"ගරු සභාපති, සී/ස ගිනිගත්හේන විවිධ සේවා සමුපකාර සමිතියේ කෝප් සිටි, හැටන් පාර, ගිනිගත්හේන,"** යන ලිපිනයට එවිය යුතුය.

සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය සමග සහතිකවල ඡායා පිටපත් එවිය යුතු අතර, එසේ පිටපත් නොමැතිව සුදුසුකම් සනාථ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(තමන් විසින් පිලියෙල කරන ලද අයදුම්පතක්, අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් සමග මෑතකදී ගත් චරිත සහතික 02 ක් සහ පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකයද, වයස තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයේ පිටපතක් සහ හැඳුනුම්පතෙහි පිටපතක්ද එවිය යුතුය.)

දැනටමත් සමුපකාර සමිතියක සේවයේ නියුක්ත අයකු තම සමිතිය මගින් ඉල්ලුම්පතක් යොමු කළ යුතුවේ.

## ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම 1

## තනතුර : සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) II හා I

**වැ. ප. අ.** : S.E.M.L 02:01

**වැ. ප.** : 22000-470x10-570x10-720x10 = 39600/-

**වයස් සීමාව** : 18 – 45

**සුදුසුකම්** :

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයක ගණකාධිකරණය / වාණිජ / කළමනාකරණය පිළිබඳ උපාධියක් හෝ උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණ/ වාණිජ ඩිප්ලෝමාවක් තිබීම.

**හෝ**

(ආ) වරලත් ගණකාධිකාරී ආයතනයේ අධියර II (Level - II) මූල්‍ය ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ පූර්ණ සාමාජිකත්වය. A.A.T.-Level-II

**හෝ**

(ඇ) S.E.M.L 02 : 05 වැ. ප. අභ්‍යන්තර විගණක හෝ S.E.M.L 02:06 වැ. ප. ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 05 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

(ඇ) ගණකාධිකරණය/ බැංකු හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් සමග S.E.M.L 02:05 වැ. ප. අභ්‍යන්තර විගණක හෝ S.E.M.L 02:06 වැ. ප. ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 02 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

(ඉ) පොත් තබන්නා තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

(සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.)

**ගරු සභාපති,**
**සී/ස ගිනිගත්හේන වි.සේ.ස. සමිතිය,**
**2022.01.13 දින**
**(051-2242233/ 051-2242710/ 051-2242119)**